# මිරිඟුව හා ප්‍රතිබිම්බය

ඉන්ද්‍රියානුභූතවාදය හා යථාර්ථවාදය අතර ඇති වෙනස්කම්වලින් ප්‍රධාන ම එකක් වනුයේ ඉන්ද්‍රියගෝචර නො වන දැහි පැවැත්ම පිළිබඳ ඇති වෙනස ය. ඉන්ද්‍රියානුභූතවාදීහු එවැනි දැහි පැවැත්ම පිළිගැනීමට අකැමැති වෙති. ඔවුනට අනුව එවැනි දේ ගැන කතා කිරම, කල්පනා කිරම නිෂ්ඵල ක්‍රියාවක් වෙයි. ඒවා ඇත් ද, නැත් ද යන්න ප්‍රායෝගී එදිනෙදා ලෝකයෙහි වැදගත් නොවන්නේ යැයි ද ඔවුහු කියති. එහෙත් යථාර්ථවාදීන්ට අනුව ඒ එසේ නො වෙයි. ඔවුනට අනුව ලෝකය නිරකෂණය කළත් නො කළත් ඒ පවතියි. එහෙත් පවතින්නේ කුමක් ද යන්න නිර්ණය කිරමේ දී ඔවුන්ට නිර්ණායක නැත. විශේෂයෙන් ම ඉන්ද්‍රිය ගෝචර නො වන සංකල්පවල දී ප්‍රශ්න මතු වෙයි.

ඉන්ද්‍රිය ගෝචර දැ පවතින්නේ යැයි යමකු කීව ද ඉන්ද්‍රිය ගෝචර නො වන දැ ඇතැයි පවසන්නේ කිනම් පදනමකින් ද? ගුරුත්වාකර්ෂණය ඇතැයි යථාර්ථවාදීහු තීරණය කරති. එහෙත් ගුරුත්වාකර්ෂණය යනු නිව්ටන් විද්වතා විසින් නිර්මාණය කරනු ලැබූ සංකල්පයක් පමණකි. ඉන්ද්‍රියානුභූතවාදීන් ඉන්ද්‍රිය ගෝචර නො වන දැ පිළිබඳව කතා නො කිරම අපට සිතාගත හැකි ය. ඉන්ද්‍රිය ගෝචර දැ ඇතැයි කීමට ඉන්ද්‍රිය ගෝචර වීම නිර්ණායකයක් ලෙස සැලකෙයි. එහෙත් ඉන්ද්‍රිය ගෝචර නොවන දැ ඇති බව හෝ නැති බව හෝ නිගමනය කිරමට යොදගන්නා නිර්ණායකය කුමක් ද?

ඉන්ද්‍රිය ගෝචර දැ සම්බන්ධයෙන් ඉන්ද්‍රියානුභූතවාදීන් හා යථාර්ථවාදීන් අතර පැහැදිලි වෙනසක් නැති වුව ද, ඒ සම්බන්ධයෙන් ද ප්‍රශ්න පවතියි. මිරිඟුව ඉන්ද්‍රිය ගෝචර වුවකි. මිරිඟුවක් ඇති බව ඈත දී පෙනී යයි. ඒ ඉන්ද්‍රිය ගෝචර වුවකි. මිරිඟුව ඇසට පෙනෙයි. එසේ නම් මිරිඟුව ඇතැයි අප පවසන්නේ ද? ඇතැමකු මෙහි දී පවසනු ඇත්තේ මිරිඟුව සමීපයට යත් ම ඒ නැති බව දැනගත හැකි බව ය. එනම් මිරිඟුව ඉන්ද්‍රිය ගෝචර නො වී යයි. යම් අයුරකින් ඒ ඉන්ද්‍රිය ගෝචර නො වී පවතින්නේ ද? අප ඒ බව දැනගන්නේ කෙසේ ද?

පසුගිය දා ඇමෙරිකන් එක්සත් ජනපදවල වෙසෙන අයකු දුම්රියක් නැති කළ බව වාර්තා වී තිබුණි. ඔහු යම් රෙදි කඩකින් දුම්රිය වසා පසුව රෙදි කඩ ඉවත් කළ විට එතැන දුම්රිය නොතිබුණේ ලු. ටික වෙලාවකට පසු නැවතත් දුම්රිය පෙනෙන්නට පටන් ගෙන ඇත. මෙය විජ්ජාවක්, ඇස් බැන්දුමක් යැයි අපි කියමු. වෙනත් අයුරකින් කිව හොත් අපට ඉන්ද්‍රිය නොමග යැවීමට හැකි ය. මෙහි දී මනසේ ක්‍රියාකාරත්වය නොසලකා සිටිය නො හැකි ය. ඇස් බැන්දුමක දී බැඳ තැබෙන්නේ ඇස ද, එසේත් නැත්නම් මනස ද?

ඒ හැරෙන්නට අප නිතර පෙන්වා දී ඇති ආකාරයට අපේ ඉන්ද්‍රියට සංවේදී වන සංසිද්ධි සංඛ්‍යාව අල්ප ය. බල්ලන්ට ඇසෙන ශබ්ද අපට නො ඇසෙයි. අපේ ඇස්වලට ගෝචර වන්නේ ආලෝකය යනුවෙන් හැඳින්වෙන විද්‍යුත් චුම්බක විකිරණ පමණකි. එහෙත් අනෙක් විකිරණ ද පවතින්නේ යැයි අපි කියමු. ඉන්ද්‍රියානුභූතවාදීන්ට එවැනි තත්ත්වයන් අමාරු ප්‍රශ්න බවට පත් වෙයි. ඉන්ද්‍රිය ගෝචර නො වන විකිරණ පවතින්නේ යැයි කියන්නේ කිනම් පදනමකින් ද?

මාක් විද්වතාට අනුව ඉන්ද්‍රිය ගෝචර නො වන සංකල්ප භාවිත කර බටහිර භෞතික විද්‍යාවෙහි සංසිද්ධි විස්තර නො කළ යුතු ය. එහෙත් ඉන්ද්‍රිය ගෝචර නො වන විකිරණ මෙන් ම ඉන්ද්‍රිය ගෝචර නො වන ගුරුත්වාකර්ෂණය ද බටහිර භෞතික විද්‍යාවෙහි දී යොදා ගැනෙයි. විකිරණ පවතින්නේත් ගුරුත්වාකර්ෂණය නො පවතින්නේත් කෙසේ ද? අප එහි දී පැවතීම හා නොපැවතීම තීරණය කිරමට යොදාගන්නා නිර්ණායක කවරේ ද? ඒ සම්බන්ධයෙන් කිසිවකුටවත් පැහැදිලි නිර්ණායක නැත.

පොළොවට පොල් වැටීම නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණයෙන් මෙන් ම අයින්ස්ටයින් විද්වතා ගේ සාධාරණ සාපේක්ෂතාවාදයෙන් ද තේරුම් කර දිය හැකි ය. එපමණක් නො ව බුධ ග්‍රහයා ඇතුළු අනෙක් ග්‍රහ වස්තූන් ගේ පූර්වායනය (Precession)- නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණයෙන් පැහැදිලි නො කෙරුණ ද සාධාරණ සාපේක්ෂතාවාදයෙන් තේරුම් කෙරෙයි. ස්ථානීය වශයෙන් ගත් කල ත්වරණයක් සහිත සමුද්දේශ රාමු (Frame

© Prof. Nalin De Silva

of reference)- මගින් ගුරුත්වාකර්ෂණය තේරුම් ගන්නා අයුරු අයින්ස්ටයින් විද්වතා පෙන්වා දී ඇත. ගුරුත්වාකර්ෂණය යනු හුදු සංකල්පයක් යැයි අපි කියමු.

මෙයින් කියැවෙන්නේ අයින්ස්ටයින් විද්වතා විසින් ඉදිරිපත් කෙරුණු අවකාශ කාලයේ වක්‍රතාව (Curvature of Space Time)- යන්න පවතින බව ද? ඒ පවතින බව අප දන්නේ කෙසේ ද? අවකාශ කාල වක්‍රතාව ඉන්ද්‍රිය ගෝචර නො වෙයි. ඉන්ද්‍රිය ගෝචර නො වන සංකල්පයක් වූ වක්‍රතාව යොදාගෙන පොළොවට පොල් වැටීම නම් ඉන්ද්‍රිය ගෝචර සංසිද්ධිය තේරුම්ගත හැකි ය. ඒ නිසා අවකාශ කාල වක්‍රතාව පවතින්නේ යැයි අපි කියමු ද? යම්කිසි අයුරකින් පොළොවට පොල් වැටීම, බුධ ග්‍රහයා ගේ පූර්වායනය සහ සාධාරණ සාපේක්ෂතාවාදයෙන් තේරුම් කර නො දෙන වෙනත් සංසිද්ධීන් ද තේරුම් කර දෙන සංකල්පයක් හා ප්‍රවාදයක් පසු කලෙක ඉදිරිපත් වුව හොත් අප අවකාශ කාල වක්‍රතාව හා සාධාරණ සාපේක්ෂතාවාදය අත් හැර ඒ අලුත් ප්‍රවාදය හා සංකල්පය නව යථාර්ථය ලෙස පිළිගනිමු ද?

මෙයින් පැහැදිලි වන්නේ ඊනියා යථාර්ථය, නව යථාර්ථය, පැරණි යථාර්ථය ආදී වශයෙන් වර්ග කළ හැකි බව ය. එවිට යථාර්ථය ද යථාර්ථයක් නො වන බව අපට පෙනී යයි. අප යථාර්ථය ලෙස ගන්නේ අපට අවශ්‍ය දේ මිස ඊනියා යථාර්ථයක් නො වෙයි. ඉන්ද්‍රිය ගෝචර වීම ඊනියා යථාර්ථය හඳුනාගැනීමට තරම් සුදුසු සංකල්පයක් නො වෙයි. ඉන්ද්‍රිය ගෝචර දෑ තේරුම් කරන ඉන්ද්‍රිය ගෝචර නො වන සංකල්ප ඊනියා යථාර්ථය තේරුම් ගැනීමේ දී ප්‍රයෝජනවත් නිර්ණායකයක් නො වෙයි.

යථාර්ථය දැන ගැනීමට තරම් ප්‍රමාණවත් නිර්ණායක නොමැති ව අපි යථාර්ථයක් ගැන කතා කරමු. ඒ අසතුටුදායක බව අමුතුවෙන් කිව යුතු නො වෙයි. මේ යථාර්ථය යන්න ද අප විසින් ඉන්ද්‍රිය ගෝචර සංකල්ප මත පදනම් වී ගොතනු ලැබ ඇති තවත් සංකල්පයක් පමණකි. පැවතීම යන සංකල්පය ම, එසේත් නැත්නම් සත්බව යන්න ම අපට පැහැදිලි ව තේරුම් ගත නොහැකි ය. සත්බව යන්නෙන් අප අදහස් කරන්නේ කුමක් ද? සත්‍යය යන වචනය සත්බව හා සම්බන්ධ බව පැහැදිලි ය. එමෙන් ම ඇත්ත යන වචනය ද ඇති බව සමග සම්බන්ධ ය. අප ඇත්ත හෙවත් සත්‍යය යැයි කීමට මුලින් පෙලඹී ඇත්තේ ඇති දේට හෙවත් සත්බවට යැයි සිතීමට ඉඩ ඇත. සෑම සංස්කෘතියක ම එසේ වුවා නො වෙයි. එහෙත් භාරතීය හා සිංහල සමාජයෙහි ඈත අතීතයෙහි එවැනි පසුබිමක් තිබෙන්නට ඇතැයි සිතෙයි.

අපි දැන් නැවතත් මිරිඟුව යන සංකල්පයට යමු. මිරිඟුව බොරුවක් මායාවක් යැයි අපි කියමු. වෛදික සංස්කෘතියෙහි බ්‍රහ්මන් සමග එක්වීම යථාර්ථය වෙයි. අපි සියලු දෙනා ම බ්‍රහ්මන් ගේ කොටස් වෙමු. අප හා කොටස් යන්න යොදා ගැනීම ද තරමක ප්‍රශ්නයක් බැවින් ඒ කිව යුතු ව ඇත්තේ බ්‍රහ්මන් යනු ලෝකය (විශ්වය) බව ය. ඇත්තේ එකකි. ඒ බ්‍රහ්මන් ය. ද්වෛතයක් හෙවත් දෙකක් හෝ වැඩි ගණනක් නැත. එහෙත් වෛදික ආගමට අනුව අපට මේ යථාර්ථය හෙවත් සත්බව හෙවත් ඇත්ත නො තේරෙයි. ඇත්ත නො තේරෙන්නේ මායාව හේතුවෙන් ය. මායාව නිසා බ්‍රහ්මන් ගෙන් වෙන් වූ මම යන සංකල්පය ඇති වෙයි. මායාව හේතුවෙන් යථාර්ථය හෙවත් බ්‍රහ්මන් ගැන තේරුම් ගැනීමට නොහැකි ය. එබැවින් අප කළ යුතු ව ඇත්තේ මායාව තුරන් කිරීම ය. මායාව නැති කළ විට බ්‍රහ්මන් තේරෙයි. එවිට මම නැති වෙයි. ඇත්තේ බ්‍රහ්මන් පමණ ය.

අද්වෛත වේදාන්තය හා නිර්ගුණ බ්‍රහ්මන් සංකල්පය යනු සංකල්ප ලෙස ගත් කල ඇති ඉතා ම වර්ධනීය වූ දෑ වෙයි. අවකාශ කාල වක්‍රතාව, ක්වොන්ටම් පැටලීම(Entanglement)- ආදී සංකල්ප ඉහත සඳහන් සංකල්ප සමග සංසන්දනය කරන විට කුඩා ළමයින් ගේ සෙල්ලම් ගෙවල් වැනි ය. නිවන යනු සංකල්පයක් හෝ නො වන බැවින් නිවන සමග කිසිවක් සංසන්දනය නො කළ හැකි ය. බ්‍රහ්මන් යන සංකල්පය ද නිර්මාණය වී ඇත්තේ නිවන අනවබෝධයෙන් ය. අප සියලු සංකල්ප නිර්මාණය කරන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අනාවබෝධය හේතුවෙන් ය.

මිරිඟුව ඇති බව අප තීරණය කරන්නේ අපට ඒ පෙනෙන බැවින් ය. ඉන්පසු මිරිඟුව නැති බව තීරණය කරන්නේ ඒ නො පෙනෙන බැවින් ය. ඒ තීරණ දෙක ම ඉන්ද්‍රිය මත පදනම් වී කෙරෙයි. ප්‍රශ්නය වන්නේ ඉන්ද්‍රිය මත විශ්වාසය තැබීම ය. මැජික් හෙවත් මායා සන්දර්ශනවල දී කෙරෙන්නේ මේ ඉන්ද්‍රිය කෙරෙහි ඇති විශ්වාසය යොදාගෙන

© Prof. Nalin De Silva

නැත්තක්, ඇත්තක් බවට පත් කිරම ය. මිරිඟුව ද ඉන්ද්‍රිය මාර්ගයෙන් නැත්තක්, ඇත්තක් බවට පත් කෙරුණු අවස්ථාවකි.

එහෙත් මෙහි දී යමකු කියනු ඇත්තේ මිරිඟුව ඇති වන්නේ කෙසේ ද යන්න බටහිර භෞතික විද්‍යාව ආශ්‍රයෙන් තේරුම් ගත හැකි බව ය. බටහිර භෞතික විද්‍යාවේ සඳහන් වර්තනය යන සංකල්පය යොදා ගැනීමෙන් මිරිඟුවක් ඇතිවන්නේ කෙසේ දැ යි විස්තර කළ හැකි බව අපි දනිමු. එයින් කියැවෙන්නේ මිරිඟුවක් නැති වුව ද, මිරිඟුවක් ඇතැයි පෙනීම විස්තර කළ හැකි බව ය. මෙය මිරිඟුවට පමණක් සීමා වුවක් නො වන බව ද අපි දනිමු.

ප්‍රතිබිම්බය යනුවෙන් කියැවෙන්නෙහි ද සිදුවන්නේ ඒ කරුණ ම ය. ඒ තේරුම් ගැනීමට පරාවර්තනය යන සංකල්පය යොදා ගැනෙයි. දර්පණ තලයක ප්‍රතිබිම්බයක් නොමැති බව අපි දනිමු. මිරිඟුවෙහි දී මෙන් නො ව තල දර්පණයක දී නම් දර්පණ තලයෙන් පිටුපසට ගොස් ප්‍රතිබිම්බයක් නැති බව දැන ගැනීමට අපට නොහැකි ය. අනෙක් අතට තාත්ත්වික ප්‍රතිබිම්බ නිර්මාණය වන අවස්ථාවල දී එලෙස ප්‍රතිබිම්බය නිර්මාණය වන තැන තිරයක් හෝ වෙනත් උපකරණයක් හෝ තබා ඒ ප්‍රතිබිම්බය අපට දැකගත හැකි වෙයි. එසේ වුවත් එවැනි අවස්ථාවක දී වුව ද ඇත්තේ ප්‍රතිබිම්බයක් පමණක් බව අපි දනිමු. තාත්ත්වික වුව ද ඒ ප්‍රතිබිම්බයක් පමණක් වෙයි.

තාත්ත්වික ප්‍රතිබිම්බයක් වුව ද අපට ඇස හැරෙන්නට වෙනත් ඉන්ද්‍රියක් ආශ්‍රයෙන් ගෝචර කර ගත නො හැකි ය. අපට පිළිමයක් ස්පර්ශ කළ හැකි වුව ද එහි ප්‍රතිබිම්බය ස්පර්ශ කළ හැකි නො වෙයි. ප්‍රතිබිම්බය ද මිරිඟුව මෙන් ම වස්තුවක් ලෙස නො පවතියි. එහෙත් ප්‍රතිබිම්බය පවතින්නේ ද යන ප්‍රශ්නය ඇසුව හොත් එයට දෙන පිළිතුර කුමක් ද? මිරිඟුව හා ප්‍රතිබිම්බය අතර වෙනස කුමක් ද? මිරිඟුව ඈතින් බැලූ කල පෙනෙයි. ළඟට ගියවිට මිරිඟුව නැත. තල දර්පණයක ප්‍රතිබිම්බයක් ඇත. එහෙත් තල දර්පණයෙන් පිටුපසට ගොස් ප්‍රතිබිම්බයක් දැකගත නොහැකි ය. තාත්ත්වික ප්‍රතිබිම්බයක් දැක ගැනීමට තිරයක් අවශ්‍ය වෙයි. එහෙත් ඒ ප්‍රතිබිම්බය ස්පර්ශ කළ නොහැකි ය. එලෙස දැක්වූ විවිධ අවස්ථා අතර ඇති වෙනස කුමක් ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva